Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2023, අගෝස්තු 31, කොළඹ

## මැගී පපරේ කොත්තු නව රසයකින් සහ ඇසුරුමකින් හඳුන්වා දෙයි.

නෙස්ලේ ලංකා සමාගමේ නූඩ්ල්ස් සන්නාමයක් වන මැගී පපරේ කොත්තු නූඩ්ල්ස් පසුගියදා නව රසයකින් සහ ඇසුරුමකින් හඳුන්වා දුනි. මේ සමඟින් ශ්‍රී ලංකාවේ ජනප්‍රිය තරු වන ශනුද්‍රි ප්‍රියසාද්, දිනේෂ් ගමගේ, දුෂ්‍යන්ත් වීරමන් සහ ස්ටෙෆනි සිරිවර්ධන සහභාගීත්වයෙන් අපූරු මියුසික් වීඩියෝවක් ද එළිදක්වන ලදී.

වැඩිදියුණු කළ මැගී පපරේ කොත්තු, නවමු සංකල්පයකට අනුව "Break-up" ලෙස නම් කල සාදයකින් හඳුන්වාදෙන ලදී. මෙම සංකල්පය අලුත් මැගී පපරේ කොත්තු එළිදැක්වීමට පෙර සිටම සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ බෙහෙවින් ජනප්‍රිය විය.

මැගී පපරේ කොත්තු රස විඳිමින් එදිනෙදා ඒකාකාරී දින චර්යාවෙන් මඳ විරාමයක් ගැනීමේ වැදගත් කම මෙම මියුසික් වීඩියෝවෙන් නිරූපණය කෙරුණි. ජනප්‍රිය තරු විසින් මෙම සංකල්පය විටෙන් විට ඔවුන්ගේ පෞද්ගලික සබඳතා හා ඈඳමින්, නිර්මාණශීලී ලෙස හඳුන්වා දුනි. ඒ හරහා නව මැගී පපරේ කොත්තු නිෂ්පාදන පෙළ වටා සාමාජ මාධ්‍ය තුළ මහත් උද්‍යෝගයක් නිර්මාණය කරන ලදි.

පන්සීයකට අධික මැගී රසිකයින් පිරිසකගේ සහභාගීත්වයෙන් Y FM මගින් සංවිධානය කරන ලද 'Break-Up' සාදය, සිරස ටීවී ස්ටයීන් මැදිරි සංකීර්ණයේදී පැවැත්වුනි.

ජනප්‍රිය තරු, සමාජ මාධ්‍ය තරු සමඟින් තරුණ පිරිස් ද නව මැගී පපරේ කොත්තු හඳුන්වාදීමේ සාදයට එක්ව සිටියහ.

වසර 30කට අධික කාලයක් පුරා ශ්‍රී ලාංකික නිවෙස් ආදරයෙන් වැළඳගත් මැගී නූඩ්ල්ස්, උසස් තත්ත්වයේ අමුද්‍රව්‍ය යොදාගනිමින් ශ්‍රී ලංකාවේදී නිෂ්පාදනය කරනු ලබයි. මෙම නවතම මැගී හඳුන්වා දීම මගින් දිවයින පුරා වෙසෙන ශ්‍රී ලාංකිකයින්ට නව මැගී පපරේ කොත්තු නිෂ්පාදන පෙළක් පිළිගැන්වේ.

1906 වසරේ ශ්‍රී ලංකාව තුළ සිය මෙහෙයුම් ආරම්භ කළ නෙස්ලේ ලංකා සමාගම වසර 115කට අධික කාලයක් පුරා ශ්‍රී ලාංකිකයින්ගේ ජීවිත තුළට සමීප වී ඇත. ශ්‍රී ලංකාව තුළ අලෙවි කරන නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි නෙස්ලේ කර්මාන්තශාලාවේ දැඩි ආහාර සුරක්ෂිතතා සහ ගුණාත්මක ප්‍රමිතීන් මත නිපදවනු ලබයි. 'වර්තමානයේ මෙන්ම අනාගත පරපුරටත් ජීවිතයේ ගුණාත්මක භාවය ආහාර ඔස්සේ වර්ධනය කිරීමේ' අරමුණ සමඟ ක්‍රියා කරන නෙස්ලේ සමාගම, ළදරුවන්ගෙ සිට වැඩිහිටියන් දක්වා පුළුල් පරාසයක පාරිභෝගිකයින් හට විවිධ ආහාර සහ පාන නිෂ්පාදන එකතුවක් තුළින් සමීප වී ඇත.

**Contact:**

Corp. Public Affairs Damitha Kulatunga +94777915949 Damitha.Kulatunga@lk.nestle.com